# ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 43 දරන රජයේ ඉඩම් විකිණීමේ (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 1973 ඔක්තෝබර් මස 17 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1973 නොවැම්බර් මස 02 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 43 දරන
රජයේ ඉඩම් විකිණීමේ (විශේෂ විධිවිධාන) පනත

එල්. ඩී.—ඕ. 78/72.

[සහතිකය සටහන් කළේ 1973 ඔක්තෝබර් මස 17 වන දින]

**කෘෂිකාර්මික සංවර්ධන කාර්යය සඳහා ඇතැම් නියමිත පන්තිවලට අයත් තැනැත්තන්හට ශ්‍රී ලංකාවේ රජයේ ඉඩම් ක්‍රමානුකූල ව විකිණීම සඳහාත් ඉඩම් සංවර්ධන ආඥාපනතේ ඇතැම් විධිවිධාන ඉවත් කිරීම සඳහාත් ඒවාට සම්බන්ධ වූ හෝ ආනුෂංගික වූ කරුණු සඳහාත් විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 43 දරන රජයේ ඉඩම් විකිණීමේ (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ලුහුඬු නාමය.

## I වන පරිච්ඡේදය

## රජයේ ඉඩම් විකිණීම

**2.** කෘෂිකාර්මික සංවර්ධන කාර්යය සඳහා මේ පනත යටතේ විකිණීමක මාර්ගයෙන් අන්සතු කිරීමට ඇති රජයේ ඉඩම් පිළිබඳ වාර්තාවක් එක් එක් පරිපාලන දිස්ත්‍රික්කයේ දිසාපති විසින් තත් කාර්යය සඳහා සපයනු ලබන ආකෘතියක් අනුව කලින් කල ඉඩම් කොමසාරිස් වෙත සැපයිය යුතුය.

තම දිස්ත්‍රික්කය තුළ විකිණීමට ඇති රජයේ ඉඩම් පිළිබඳ වාර්තාවක් දිසාපති විසින් සැපයිය යුතු බව.

**3.** 2 වන වගන්තිය යටතේ වාර්තාවක් ලැබුණු කල්හි, ඒ වාර්තාවෙහි විකිණිය යුතු ඉඩම් කිසිවක් සඳහන් කර ඇතහොත් ඒ ඉඩම්වලින් කිනම් ප්‍රමාණයක් විකිණිය යුතු දැයි ඉඩම් කොමසාරිස් විසින් තීරණය කළ යුතුය.

ඉඩම් කොමසාරිස් විසින් ඒ වාර්තාව සම්බන්ධයෙන් ක්‍රියා කළයුතු බව.

**4.** ඉඩම් කොමසාරිස් විසින් 3 වන වගන්තිය යටතේ ගනු ලබන තීරණය ද ඒ ඉඩම් බැහැර කිරීමේ ක්‍රමය හා ආකාරය පිළිබඳ උපදෙස් ද දිසාපති වෙත දැන්විය යුතුය.

ඉඩම් කොමසාරිස් විසින් තම තීරණය දිසාපති වෙත දන්විය යුතු බව.

**5.** (1) ඉඩම් කොමසාරිස් විසින් නිකුත් කරනු ලබන සාමාන්‍ය හෝ විශේෂ උපදෙස් කිසිවකටත් ඒ හා සම්බන්ධ නියෝග කිසිවකටත් යටත් ව, විකිණීමක මාර්ගයෙන් රජයේ ඉඩම් අන්සතු කිරීම සඳහා නියමිත ආකාරයෙන් පළ කරන ලද නිවේදනයක් මඟින් ඉල්ලුම් පත් කැඳවීම දිසාපති විසින් කළ යුතුය.

රජයේ ඉඩම් විකිණීම පිළිබඳ නිවේදනය.

2——ඒ 00929—15,642 (73/10)

(2) එබඳු සෑම නිවේදනයක් ම නියමිත ආකෘතියෙහි විය යුතු අතර ඉල්ලුම් පත් ඉදිරිපත් කළ යුත්තේ කවර දිනයකට පෙර දැ යනු එමඟින් නියම කළ යුතුය.

(3) නිවේදනය මගින් එසේ දිනයක් නියම කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ දිනයෙන් පසු ඉදිරිපත් කරන ලද යම් ඉල්ලුම් පතක් භාර ගැනීම හෝ සලකා බැලීම ප්‍රතික්ෂේප කිරීම දිසාපති විසින් තම අභිමතය පරිදි කළ හැකිය.

රජයේ ඉඩම කවර තැනැත්තන් සතු කළ හැකි ද යන වග.

6. (1) ශ්‍රී ලංකා ජනරජයේ පුරවැසියකු වූ තැනැත්තකුට හැර වෙන යම් තැනැත්තකුට මේ පනත යටතේ රජයේ කිසි ම ඉඩමක් සතු කර නොදිය යුතුය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන කඩ කරමින් යම් ඉඩම් අන්සතු කිරීමක් කරනු ලැබුවහොත් එම අන්සතු කිරීම ශුන්‍ය හා බල රහිත විය යුතු අතර ඒ අන්සතු කිරීමේ සාධන පත්‍රය යටතේ සතු කරනු ලබන්නාට කිසි ම අයිතිවාසිකමක්, හිමිකමක් හෝ සම්බන්ධතාවක් අත් නොවිය යුතුය ; නැතහොත් අත් වී ඇතැයි නොසැලකිය යුතුය.

(3) ඉඩම් සතු කර දෙනු ලබන තැනැත්තන්, නියම කරනු ලබන පන්තියකට අයත් තැනැත්තන් අතුරින් තෝරා ගත යුතුය.

(4) තැනැත්තන් තෝරා ගැනීමේ ක්‍රමය හා ආකාරය නියමිත පරිදි විය යුතුය.

(5) ඉඩම් සතු කර දෙන ලෙස ඉල්ලුම් කළ තැනැත්තන් ඒ ඉඩම් සතු කර දීම සඳහා තෝරා ගනු ලැබ ඇද්ද නැද්ද යන්න ඔවුන් සියලු දෙනා වෙත නිවේදනය කිරීම දිසාපති විසින් කළ යුතුය.

ඉඩම් කොමසාරිස් වෙත අභියාචනය කිරීම.

7. (1) පහත සඳහන් හේතු මත, නියමිත ආකාරයෙන් වූ අභියාචනයක් ඉඩම් කොමසාරිස් වෙත ඉදිරිපත් කළ හැකි වන්නේය.

(අ) ඉල්ලුම් පත් කැඳවීමේ නිවේදනය 5 (1) වන වගන්තියේ විධිවිධානවලට හෝ ඒ යටතේ සාදන ලද නියෝගවලට අනුකූල ව පළ කරනු නොලැබීම ; හෝ

(ආ) තෝරා ගැනීම 6 වන වගන්තියේ (1), (3) හෝ (4) වන උපවගන්තිවලට පටහැනි ව කර තිබීම.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ සෑම අභියාචනයක් ම තත් කාර්යය සඳහා නියම කරනු ලබන කාලයක් ඇතුළත ඉඩම් කොමසාරිස් විසින් විභාග කොට නිශ්චය කළ යුතුය. ඒ අභියාචනය

සම්බන්ධයෙන් ඉඩම් කොමසාරිස්ගේ තීරණය අවසාන හා තීරණාත්මක විය යුතු අතර කිසි ම අධිකරණයක දී එය ප්‍රශ්න නොකළ යුතුය.

8. 7 වන වගන්තිය යටතේ යම් ඉඩමක් සම්බන්ධයෙන් අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබ ඇද්ද ඒ අභියාචනය පිළිබඳ තීරණය ඉඩම් කොමසාරිස් විසින් තමන් වෙත දන්වා එවනු ලබන තෙක් ඒ අභියාචනයට සම්බන්ධ යම් ඉඩමක් දිසාපති විසින් අන්සතු නොකළ යුතුය.

අභියාචනයකට සම්බන්ධ ඉඩමක් දිසාපති විසින් අන්සතු නොකළ යුතු බව.

9. ඒ ඉඩම විකිණිය යුතු මිල ඉඩම් කොමසාරිස් විසින් නිශ්චය කළ යුතුය.

ඉඩමක් මිලට ගැනීම සඳහා ගෙවිය යුතු මිල.

## II වන පරිච්ඡේදය

## ප්‍රදාන පත්‍ර සහ අවසර පත්‍ර

10. (1) තෝරාගත් තැනැත්තකු වෙත 6 වන වගන්තියේ (5) වන උපවගන්තිය යටතේ නිවේදනයක් කරනු ලැබූ අවස්ථාවක, සම්පූර්ණ ගැනුම් මිල වහාම ගෙවන්නේ ද නැතහොත් එය කොටස් වශයෙන් ගෙවීමට අපේක්ෂා කරන්නේ ද යනු ඔහු විසින් තීරණය කළ යුතුය. තෝරාගත් දින සිට සති දෙකක් ඇතුළත ඒ තීරණය ඔහු විසින් දිසාපති වෙත නිවේදනය කළ යුතුය.

ගෙවීම වහාම කෙරේ ද නැතහොත් කොටස් වශයෙන් කෙරේ ද යන වග.

(2) සම්පූර්ණ ගැනුම් මිල වහාම ගෙවීමට ඒ තැනැත්තා තීරණය කළ අවස්ථාවක, ඒ තීරණය ගත් තැන් සිට මාසයක් ඇතුළත ඔහු ඒ තීරණය අනු ව දිසාපති වෙත ගෙවීම කළ යුතුය.

11. සම්පූර්ණ ගැනුම් මිල 10 වන වගන්තියේ (2) වන උප වගන්තිය යටතේ ගෙවනු ලැබූ විට, තමා විසින් මිලට ගන්නා ලද ඉඩම තම සන්තකයට ගැනීමටත් ඒ ඉඩම සම්බන්ධයෙන් ප්‍රදාන යක් ලැබීමටත් ඒ තැනැත්තාට හිමිකම් ඇත්තේ ය.

ප්‍රදානය කෙරෙනුයේ කවර විටක ද යන වග.

12. ඒ තැනැත්තා විසින් 10 වන වගන්තියේ (2) වන උප වගන්තිය යටතේ සම්පූර්ණ ගැනුම් මිල ගෙවීම පැහැර හැරි අවස්ථාවක, ඒ ඉඩම ඒ තැනැත්තාහට විකිණීම ප්‍රතික්ෂේප කිරීමට දිසාපතිට හිමිකම් ඇත්තේ ය.

විකිණීම අවලංගු කිරීම.

13. (1) 11 වන වගන්තිය යටතේ නිකුත් කෙරෙන සෑම ප්‍රදාන පත්‍රයක් ම නියමිත ආකෘතියට සාරානුකූල විය යුතු අතර පහත දැක්වෙන කොන්දේසි එහි ඇතුළත් විය යුතුය.

ප්‍රදාන ආකෘතිය සහ එහි කොන්දේසි.

(i) දිසාපතිගේ කැමැත්ත කල්තබා ම ලියවිල්ලකින් ලැබගෙන මිස ප්‍රදානයට විෂය වී ඇති ඉඩම ප්‍රදාන පත්‍රය දරන්නා විසින් බැහැර නොකළ යුතුය;

(ii) නියම කරනු ලබන අතුරු බෙදුම් ඒකකයට වඩා ප්‍රමාණයෙන් අඩු, ඒ ඉඩම් කොටසක් ප්‍රදාන පත්‍රය දරන්නා විසින් බැහැර නොකළ යුතුය;

(iii) ඒ ඉඩම හවුල් අයිතියට යටත් වන පරිදි ඒ ඉඩම හෝ ඒ ඉඩමේ කොටසක් හෝ ප්‍රදාන පත්‍රය දරන්නා විසින් බැහැර නොකළ යුතුය.

(2) වතුබෝග වගා කිරීම සඳහා විකුණන යම් ඉඩමක් සම්බන්ධයෙන් අතුරු බෙදුම් ඒකකය නියම කරන සෑම නියෝගයක් ම සෑදිය යුත්තේ වැවිලි කර්මාන්ත විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිවය.

ප්‍රදාන පත්‍ර ලියාපදිංචි කිරීම.

14. (1) සෑම ප්‍රදාන පත්‍රයක් ම නිකුත් කරනු ලැබූ විට, දිසාපතිගේ ඉල්ලීම අනු ව නියමිත ආකාරයෙන් එය ලියාපදිංචි කළ යුතුය.

(2) ඒ ලියාපදිංචි කිරීම වෙනුවෙන් කිසි ම ගාස්තුවක් ගෙවීම හෝ ලබා ගැනීම නොකළ යුතුය.

රේඛා සටහනක් ප්‍රදාන පත්‍රයට ඇමිණිය යුතු බව.

15. එබඳු යම් ප්‍රදාන පත්‍රයක් අනු ව අන්සතු කරනු ලබන ඉඩමක් සර්වේයර් ජනරාල් විසින් හෝ ඔහුගේ අධිකාරය යටතේ පිළියෙළ කරනු ලැබ ඔහු භාරයේ ඇති පිඹුරක් ආශ්‍රයෙන් විස්තර කළ යුතුය. ඒ එක් එක් ප්‍රදාන පත්‍රය අනු ව විකුණනු ලබන ඉඩමේ රේඛා සටහනක් ඒ ප්‍රදාන පත්‍රයට ඇමිණිය යුතුය. රේඛා සටහන සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කළ යුතු වුව ද එය එසේ පිළියෙළ කළ බවට සහතිකයක් රේඛා සටහනෙහි ඇතුළත් කිරීම අවශ්‍ය නොවේ.

නියමිත ගාස්තුව ගෙවූ විට පිටපතක් සැපයිය යුතු බව.

16. යම් ඉල්ලුම්කරුවකු විසින් නියමිත ගාස්තුව ගෙවූ විට, යම් පිඹුරක හෝ එහි යම් කොටසක පිටපතක් ඔහු වෙත නිකුත් කිරීමට සර්වේයර් ජනරාල් විසින් සැලැස්විය යුතුය.

කොටස් වශයෙන් ගෙවීම.

17. තෝරා ගනු ලැබූ තැනැත්තකු විසින් 10 වන වගන්තිය යටතේ ඒ ඉඩම සඳහා කොටස් වශයෙන් ගෙවීමට තීරණය කරනු ලද අවස්ථාවක දී පොලිය ගෙවීම ද ඇතුළු ව ඒ ගැණුම් මුදල වාර්ෂික කොටස් වශයෙන් ගෙවීමෙහි ලා සුදුසු යයි අමාත්‍යවරයා අදහස් කරන හෝ අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන හෝ නියමයන්ට යටත් ව එසේ නියම කරනු ලබන වාර්ෂික කොටස් වශයෙන් ගෙවීමට දිසාපති විසින් ඉඩ දිය යුතුය.

**අවසර පත්‍රය ප්‍රදානය කරනු ලබන අවස්ථා.**

18. (1) ගැනුම් මුදල වාර්ෂික කොටස්වලින් ගෙවීමට දිසාපති විසින් 17 වන වගන්තිය යටතේ තැනැත්තකුට ඉඩ දෙනු ලබන අවස්ථාවක, නියමිත ආකෘතියට සාරානුකූල වූ අවසර පත්‍රයක් ඔහු වෙත නිකුත් කොට ඒ අවසර පත්‍රය අනු ව සතු කර දෙන ලද ඉඩමේ සන්තකය ඔහුට භාර දිය යුතු ය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලබන ඒ අවසර පත්‍රයෙහි—

(අ) ඒ වාර්ෂික කොටස් ගෙවීම ආරම්භ වන දිනය;

(ආ) ඒ කොටස් ගෙවීම් ගණන; හා

(ඇ) ඒ එක් එක් කොටසින් ගෙවිය යුතු මුදල් ප්‍රමාණය

ඇතුළත් විය යුතු ය.

**ඉඩම මැනීම හා අවසර පත්‍රය ලියාපදිංචි කිරීම.**

19. එබඳු අවසර පත්‍රයක් අනු ව අන්සතු කරදෙන ලද ඉඩම දිසාපති විසින් සර්වේයර් ජනරාල් ලවා හෝ සර්වේයර් ජනරාල්ගේ බලය යටතේ මන්නවා එසේ මන්නවා ගත් ඉඩමේ ප්‍රමාණය හා විස්තරය ඒ අවසර පත්‍රයෙහි ඇතුළත් කළ යුතුය. ඒ ප්‍රමාණය හා විස්තර සම්බන්ධ කරුණු අවසර පත්‍රයෙහි ඇතුළත් කිරීමෙන් පසු, දිසාපති විසින් අවසර පත්‍රය ලියාපදිංචි කිරීමට සැලැස්විය යුතු ය; ඒ ලියාපදිංචි කිරීම වෙනුවෙන් කිසි ම ගාස්තුවක් ගෙවීම හෝ ලබා ගැනීම නොකළ යුතුය.

**ප්‍රදාන පත්‍රය ලබා ගන්නා තුරු අවසර පත්‍රය වලංගුව පැවතිය යුතු බව.**

20. ඒ අවසර පත්‍රය 27 වන වගන්තිය යටතේ කලින් අවලංගු කරනු නොලැබුවහොත්, අවසර පත්‍රය යටතේ අවසර පත්‍ර හිමියා විසින් ගෙවිය යුතු සියලු ම මුදල් ගෙවා 21 වන වගන්තිය යටතේ ඒ ඉඩම සම්බන්ධයෙන් ප්‍රදානයක් ලබාගන්නා තුරු අවසර පත්‍රය වලංගු ව පැවතිය යුතුය.

**අවසර පත්‍රයක් ප්‍රදාන පත්‍රයක් බවට පරිවර්තනය කෙරෙන අවස්ථාව.**

21. 17 වන වගන්තිය යටතේ අවසර පත්‍ර හිමියකු විසින් ගෙවීමට නියමිත සියලු ම මුදල් ඔහු විසින් ගෙවනු ලැබ ඇති අවස්ථාවක, ඒ ඉඩම සම්බන්ධයෙන් 11 වන වගන්තිය යටතේ ප්‍රදානයක් ලැබීමට ඔහුට හිමිකම් ඇත්තේ ය.

**ප්‍රදාන පත්‍රයක හෝ අවසර පත්‍රයක කොන්දේසි, ඉඩම හා සමගාමී වියයුතු බව.**

22. එබඳු යම් ප්‍රදාන පත්‍රයක හෝ අවසර පත්‍රයක ඇතුළත් කොන්දේසි, ඒ ප්‍රදාන පත්‍රයේ හෝ අවසර පත්‍රයේ සඳහන් දින සිට ඉඩම හා සමගාමී විය යුතු අතර මුල් ප්‍රදාන පත්‍රය දරන්නා හෝ මුල් අවසර පත්‍රය දරන්නා සහ යම් තැනැත්තකු ඊට හිමිකම් ලැබුව හොත් ඒ සියලු තැනැත්තෝ ද ඒවායින් බැඳී සිටින්නාහ.

## III වන පරිච්ඡේදය

### අවසර පත්‍ර හෝ ප්‍රදාන පත්‍ර අනු ව හිමි ව තුබූ ඉඩම් ආරක්ෂා කිරීම

**අවසර පත්‍ර හෝ ප්‍රදාන පත්‍ර මගින් හිමිව තිබූ ඉඩම් ආරක්ෂා කිරීම.**

23. මේ පනත යටතේ නිකුත් කරනු ලබන අවසර පත්‍රයක් හෝ ප්‍රදාන පත්‍රයක් ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ නිකුත් කරනු ලැබූ ප්‍රදාන පත්‍රයක් හෝ අවසර පත්‍රයක් වූයේ නම් අදාල විය හැකි ආකාරයට හා ප්‍රමාණයට ඉඩම් සංවර්ධන ආඥාපනතේ 39 වන හා 40 වන වගන්තිවල විධිවිධාන ඒ ප්‍රදාන පත්‍රයට හෝ අවසර පත්‍රයට අදාළ වන්නේ ය.

## IV වන පරිච්ඡේදය

### ඉඩම් බැහැර කිරීම

ප්‍රදාන පත්‍රයක් හෝ අවසර පත්‍රයක් මගින් හිමි ව තිබූ ඉඩමක් බැහැර කිරීම.

**24.** යම් ඉඩමක් අවසර පත්‍රයක හෝ ප්‍රදාන පත්‍රයක මාර්ගයෙන් මේ පනත යටතේ අන්සතු කර ඇති අවස්ථාවක, ඒ අවසර පත්‍රය හෝ ප්‍රදාන පත්‍රය ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ නිකුත් කරනු ලැබුවාක් මෙන් සලකා ඉඩම් සංවර්ධන ආඥාපනතේ 42 සිට 47 දක්වා (දෙක ම ඇතුළුව) වූ වගන්තිවල විධිවිධාන ඒ ඉඩමට අදාළ වන අතර, එකී විධිවිධාන අදාළ කිරීමේ දී පහත දැක්වෙන වෙනස් කිරීම්වලට යටත් ව එකී ආඥාපනත කියවා තේරුම් ගත යුතුය :—

(i) ඒ ආඥාපනතේ 43 වන වගන්තියේ (ආ) ඡේදයේ " හෝ ලියාපදිංචි කළ සමිතියක් " යන වචන වෙනුවට " හෝ ලංකා බැංකුව හෝ ලියාපදිංචි කළ සමිතියක් " යන වචන ආදේශ කළ විටක මෙන් ; හා

(ii) ඒ ආඥාපනතේ 47 වන වගන්තියේ (1) වන උපවගන්තියේ " සමූපකාර සමිති ආඥාපනතේ 53 වන වගන්තිය යටතේ " යන වචන වෙනුවට " ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමූපකාර සමිති පනතේ 58 වන වගන්තිය යටතේ " යන වචන ආදේශ කළ විටක මෙන් :

එසේ වුව ද දිසාපතිගේ කැමැත්ත ලියවිල්ලකින් ලබා ගෙන, මේ පනත යටතේ අවසර පත්‍ර හිමියා විසින්, ඒ අවසර පත්‍රය යටතේ තමන් වෙත සතු කර දෙන ලද ඉඩමෙහි ඇති තම අයිතිවාසිකම, හිමිකම හෝ සම්බන්ධතා පවරා දිය හැකිය.

## V වන පරිච්ඡේදය

### උරුමවීම

ප්‍රදාන පත්‍ර හෝ අවසර පත්‍ර දරන්නාගේ අන්තිම කැමති පත්‍රයට ඇතැම් සීමාවන් තිබිය යුතු බව.

**25.** (1) ප්‍රදාන පත්‍ර දරන්නකු හෝ අවසර පත්‍ර දරන්නකු විසින් තමාට හිමි ව තුබූ ඉඩමක් තම අන්තිම කැමති පත්‍රය මගින් නිශ්චිත ලෙස බැහැර කළ හැකිය.

(2) ඒ ප්‍රදාන පත්‍රයේ හෝ අවසර පත්‍රයේ ඇතුළත් කොන්දේසි නැතහොත් මේ පනතේ විධිවිධාන කිසිවක් එසේ බැහැර කිරීම නිසා කඩ වුව හොත් (1) වන උපවගන්තිය යටතේ වූ යම් බැහැර කිරීමක් අවලංගු වන්නේ ය.

(3) අන්තිම කැමති පත්‍රයක් මගින් එබඳු යම් බැහැර කිරීමක් මේ වගන්තියේ (2) වන උපවගන්තියට අනුකූල නොවූ අවස්ථාවක, ඒ බැහැර කිරීම අවලංගු වන අතර ඒ ඉඩම සම්බන්ධයෙන් ඒ ප්‍රදාන පත්‍ර දරන්නා හෝ අවසර පත්‍ර දරන්නා අන්තිම කැමති පත්‍රයක් නොමැති ව මිය ගිය ලෙස සැලකිය යුතුය.

අන්තිම කැමති පත්‍රයක් නොමැතිව මිය ගිය විට අයිතිය උරුමවීම.

**26.** ප්‍රදාන පත්‍ර දරන්නකු හෝ අවසර පත්‍ර දරන්නකු අන්තිම කැමති පත්‍රයක් නොමැති ව මිය ගිය හොත් හෝ ඔහු 25 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ අන්තිම කැමති පත්‍රයක් නොමැති ව මිය ගොස් ඇතැයි සලකනු ලැබුව හොත් හෝ ඔහු විසින් ශේෂකොට ඇති යම් අන්තිම කැමති පත්‍රයක ප්‍රොබේට් බලපත්‍රය නිසි අධිකරණ බලය ඇති අධිකරණයක ආඥාවක් මගින් ප්‍රතික්ෂේප

කිරීම හෝ අවලංගු කිරීම හෝ නිෂ්ප්‍රභ කිරීම කරනු ලැබුවහොත් මේ පනතේ උපලේඛනයේ 1 වන රීතියේ නියමිත පරිදි ඒ ඉඩමේ අයිතිය උරුම වන්නේ ය.

## VI වන පරිච්ඡේදය

### අවසර පත්‍ර අවලංගු කිරීම

*දිසාපති විසින් අවසර පත්‍ර අවලංගු කළ යුතු බව.*

**27.** මේ පනත යටතේ නිකුත් කෙරෙන අවසර පත්‍රයක දක්වෙන වාර්ෂික කොටස් ගෙවීම් ඒ අවසර පත්‍රයේ කොන්දේසි අනු ව ගෙවනු නොලැබ ඇති අවස්ථාවක, දිසාපති විසින් ඒ අවසර පත්‍රයෙහි හෝ එහි සහතික පිටපතක කරනු ලබන පිටසනක් මගින් ඒ අවසර පත්‍රය අවලංගු කළ හැකිය :

එසේ වුව ද ඒ අවසර පත්‍රය යටතේ ගෙවිය යුතු මුදල් ගෙවීමට බැඳී ඇති තැනැත්තාට යෝජිත අවලංගු කිරීමට විරුද්ධ ව කරුණු දක්වීමේ අවස්ථාවක් ලබා දී තිබිය යුතුය.

*ඉඩමෙන් ඉවත් වන ලෙස දැන්වීමක් බුක්තිය ඇති පාර්ශවකරු වෙත නිකුත් කළ යුතු බව.*

**28.** යම් අවසර පත්‍රයක් 27 වන වගන්තිය යටතේ අවලංගු කරනු ලැබූ අවස්ථාවක, ඒ අවසර පත්‍රය යටතේ අන්සතු කරන ලද ඉඩම තම සන්තකයට හෝ බුක්තියට ගෙන සිටින යම් තැනැත්තකු අප්‍රමාදව ඉඩමෙන් ඉවත් විය යුතු යයි ඒ තැනැත්තාට නියම කෙරෙන දැන්වීමක් දිසාපති විසින් ඔහු වෙත භාරදීමට සැලැස්විය යුතුය.

*දැන්වීම භාරදෙනු ලැබූ තැනැත්තා ඉඩමෙන් ඉවත් ව යාම ප්‍රතික්ෂේප කළ හොත් මහෙස්ත්‍රාත්වරයකු වෙත වාර්තා කළ යුතු බව.*

**29.** 28 වන වගන්තිය යටතේ දැන්වීමක් නිකුත් කරනු ලැබූ යම් තැනැත්තකු එසේ නිකුත් කොට භාර දෙන ලද දැන්වීම අනු ව අප්‍රමාද ව ඉඩමෙන් ඉවත් ව එහි සන්තකය භාරදීම පැහැර හැරි අවස්ථාවක දිසාපති විසින් හෝ ඔහු වෙනුවෙන් තත් කාර්යය සඳහා පත් කරන ලද වෙන යම් තැනැත්තකු විසින්, ඒ ඉඩමට සම්බන්ධ අවසර පත්‍රය විධිමත් ලෙස අවලංගු කරනු ලැබ ඇති බවත් ඒ වාර්තාවේ නම සඳහන් තැනැත්තා නීති විරෝධි ලෙස ඒ ඉඩම තම සන්තකයෙහි හෝ බුත්තියෙහි තබා ගෙන සිටින බවත් 28 වන වගන්තිය යටතේ දැන්වීමක් භාර දෙනු ලැබුව ද ඒ ඉඩමෙන් ඉවත් ව යාම ඔහු පැහැර හැර ඇති බවත් සඳහන් ලිඛිත වාර්තාවක් මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කළ හැකිය.

*සිතාසි නිකුත් කළ යුතු බව.*

**30.** 29 වන වගන්තිය යටතේ තමා වෙත ඉදිරිපත් කරන ලද ලිඛිත වාර්තාව ලැබුණු කල්හි මහෙස්ත්‍රාත්වරයා විසින් ඒ වාර්තාවේ නම සඳහන් තැනැත්තා ඉඩමෙන් නෙරපිය යුතු නොවන්නේ මන්දැයි නිශ්චිත දිනයක තමන් ඉදිරියේ පෙනී සිට කරුණු දක්වන ලෙස ඔහු වෙත අප්‍රමාද ව සිතාසි නිකුත් කළ යුතුය.

*හේතු නොදක්වූ විට නෙරපීමේ ආඥාව නිකුත් කිරීම.*

**31.** 30 වන වගන්තිය යටතේ සිතාසියක් නිකුත් කරනු ලැබූ තැනැත්තා ඒ සිතාසියෙහි දක්වෙන දිනයෙහි පෙනී සිටීම පැහැර හැරිය හොත් හෝ පෙනී සිට නෙරපීමේ ආඥාවකට විරුද්ධව තමන් විසින් දැක්විය හැකි කිසි ම හේතුවක් නැතැයි අධිකරණයට දැන් වුව හොත්, ඒ තැනැත්තා ඉඩමෙන් නෙරපන ලෙස නියම කෙරෙන ආඥාවක් අධිකරණය විසින්, අප්‍රමාද ව නිකුත් කළ යුතුය.

හේතුවක් දක් වුව හොත් විභාගයක් පැවැත්විය යුතු බව.

**32.** 30 වන වගන්තිය යටතේ සිතාසිය නිකුත් කරනු ලැබූ තැනැත්තා එම සිතාසියෙහි දක්වෙන දිනයෙහි පෙනී සිට නෙරපීමේ ආඥාවක් නිකුත් කිරීමට විරුද්ධ ව හේතු දැක්වීමට ඇතැයි ප්‍රකාශ කළ හොත්, මහෙස්ත්‍රාත්වරයා විසින් අප්‍රමාද ව කරුණු විභාග කිරීම ආරම්භ කළ හැකිය; නැතහොත් නඩුව තවත් දිනයක විභාග කිරීම සඳහා තැබීමට නියම කළ හැකිය.

නෙරපීමේ ආඥාව.

**33.** විභාගයෙන් පසු, හේතු දැක්වූ තැනැත්තා ඉඩමේ සන්තක යට හෝ බුත්තියට හිමිකම් ලබතැයි මහෙස්ත්‍රාත්වරයා සෑහීමට පත් නො වුව හොත්, ඒ තැනැත්තා අප්‍රමාද ව ඉඩමෙන් නෙරපීමට නියම් කෙරෙන ආඥාවක් මහෙස්ත්‍රාත්වරයා විසින් කළ යුතුය.

නෙරපීමේ ආඥාව ක්‍රියාවේ යෙදවීම.

**34.** (1) දිසාපති විසින් හෝ වෙනත් නියමිත නිලධරයකු විසින් ඉල්ලීමක් කරනු ලැබූ කල්හි, නෙරපීමේ ආඥාවෙන් බැඳී සිටින යම් තැනැත්තකු ඉඩමෙන් නෙරපා ඉඩමේ සන්තකය දිසාපතිට හෝ ඒ වෙනත් නියමිත නිලධරයාට භාර දෙන ලෙස මහෙස්ත්‍රාත් වරයා විසින් පිස්කල්ට හෝ සාම නිලධරයකුට විධාන කළ යුතුය.

(2) නෙරපීමේ ආඥාව ක්‍රියාවේ යෙදවීමේ වගකීම පැවරුණු පිස්කල් හෝ සාම නිලධරයා විසින් මහෙස්ත්‍රාත්වරයාගේ විධාන පිළිපැද ඔහු ආඥාව ක්‍රියාවේ යෙද වූ ආකාරය විධිමත් ලෙස වාර්තා කළ යුතුය.

(3) නෙරපීමේ ආඥාවක් ක්‍රියාවේ යෙදවීමෙහි ලා පිස්කල් විසින් හෝ සාම නිලධරයා විසින් නැතහොත් ඒ දෙදෙනාගෙන් එක් කෙනකුගෙන් බලය ලත් යම් නිලධරයකු විසින් ඉඩමට ඇතුළු වීමට හෝ නෙරපීමේ ආඥාවෙන් බැඳුණු යම් තැනැත්තකු නෙරපා ඉඩමේ සන්තකය දිසාපති හෝ වෙනත් නියමිත නිලධරයකු වෙත භාරදීමට අවශ්‍ය බලය යෙදවිය හැකිය.

අවලංගු කිරීමේ දී කලින් ගෙවූ කොටස් මුදල් ආපසු ගෙවිය යුතු බව.

**35.** (1) යම් අවසර පත්‍රයක් 27 වන වගන්තිය යටතේ අවලංගු කරනු ලැබූ අවස්ථාවක, ඒ අවසර පත්‍රය අනු ව ගෙවා ඇති කොටස් මුදල් දිසාපති විසින් අවසර පත්‍ර දරන්නාට ආපසු ගෙවිය යුතුය.

(2) කොටස් මුදල් වශයෙන් ගෙවනු ලද ඒ මුදල් ප්‍රමාණයෙන්, ඒ අවසර පත්‍රය යටතේ ඉඩම බුත්තියට ගෙන සිටි කාලසීමාව වෙනුවෙන් නියමිත ප්‍රමාණය අනු ව ගණන් බැලූ මුදලක් දිසාපති විසින් අඩුකර ගත යුතුය.

ඉඩම සංවර්ධන ආඥාපනත යටතේ ඉඩම සතු කර ගත් තැනැත්තන්ට මේ පනත යටතේ ඉඩම මිලට ගැනීමට අයිතිය ඇති බව.

**36.** (1) ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ අන්සතු කරන ලද යම් ඉඩමකට නීත්‍යානුකූල ව හිමිකම, මේ පනත ක්‍රියාත්මකවීමට පෙරාතු ව ම වූ දිනයෙහි දී අවසර පත්‍ර දරන්නකුගේ හෝ අයිතිකරුවකුගේ තත්ත්වයෙන් ලත් සෑම තැනැත්තකු විසින් ම, මේ පනත යටතේ ඒ ඉඩම තත් කාර්යය සඳහා නිශ්චිත ව සඳහන් යම් කාලයක් ඇතුළත දී මිලට ගැනීමේ සහ මේ පනතේ 11 වන වගන්තිය යටතේ ඒ ඉඩම සම්බන්ධයෙන් ප්‍රදානයක් ලැබීමේ අයිතිවාසිකම ලැබෙන්නේ ය.

(2) ඒ තැනැත්තා විසින් ගෙවිය යුතු මුදල් ප්‍රමාණය ඉඩම් කොමසාරිස් විසින් නිශ්චය කළ යුතුය.

**37.** 1942 අංක 61 දරන ඉඩම් නිදහස් කිරීමේ ආඥාපනතේ විධිවිධාන යටතේ අත් කර ගනු ලැබ, ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ නිකුත් කරනු ලැබූ අවසර පත්‍රයක් හෝ ප්‍රදාන පත්‍රයක් මගින් ඉඩමක් හිමිකර ගනු ලැබූ අවස්ථාවක, මේ පනතේ 36 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ඒ ඉඩම අන්සතු කිරීම සඳහා ප්‍රදාන පත්‍රයක් නිකුත් කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් විධිවිධාන අදාළ වන්නේ ය:—

ඉඩම් නිදහස් කිරීමේ ආඥාපනත යටතේ අත්කර ගනු ලැබ ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රයක් මගින් හෝ අවසර පත්‍රයක් මගින් අන්සතු කරනු ලැබූ ඉඩම් සම්බන්ධයෙන් විශේෂ විධිවිධාන අදාළ වන බව.

(අ) ප්‍රදාන පත්‍රය නියමිත ආකෘතියෙහි විය යුතුය.

(ආ) ඒ ප්‍රදාන පත්‍රය අනු ව හිමිකර ගත් ඉඩමකට මේ පනතේ 13, 23, 24, 25, 26, 44, 45 සහ 51 වන වගන්තිවල විධිවිධාන අදාළ නොවන්නේ ය.

(ඇ) ප්‍රදානය, රජයේ ඉඩම් ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ කරන ලද පරම ඉඩම් ප්‍රදානයක් වූ විටක මෙන්, බල පැවැත්විය යුතු අතර ඒ ආඥාපනතේ විධිවිධාන ඒ ප්‍රදාන පත්‍රය යටතේ ඉඩම සතු කර ගත් තැනැත්තාගේ අයිතිවාසිකමට, හිමිකමට හා සම්බන්ධතාවට අදාළ වන්නේ ය.

**38.** (1) 36 වන වගන්තිය යටතේ එකී තැනැත්තා විසින් දිසාපති වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබූ විට සම්පූර්ණ ගැණුම් මිල වහාම ගෙවන්නේ ද නැතහොත් එය කොටස් වශයෙන් ගෙවීමට අපේක්ෂා කරන්නේ ද යන්න නිශ්චිත කාලයක් ඇතුළත දී තීරණය කරන ලෙස දිසාපති විසින් එකී තැනැත්තාට නියම කළ යුතුය.

ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ සතු කරනු ලබන්නා විසින් කරනු ලබන යම් ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලබන අවස්ථා.

(2) සම්පූර්ණ ගැණුම් මිල වහාම ගෙවීමට යම් තැනැත්තකු තීරණය කරන අවස්ථාවක ඔහු විසින් ඒ අනු ව එසේ තීරණය කිරීමෙන් පසු එක් මාසයක් ඇතුළත දී එකී ගෙවීම දිසාපති වෙත කළ යුතුය.

(3) කොටස් වශයෙන් ගෙවීමට යම් තැනැත්තකු තීරණය කරන අවස්ථාවක දිසාපති විසින්, ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ එකී තැනැත්තාට නිකුත් කරන ලද ඒ අවසර පත්‍රය මත හෝ ප්‍රදාන පත්‍රය මත හෝ දිසාපති විසින් අත්සන් කරනු ලැබූ එයට යා කොට ඇති කඩදාසි තීරුවක් මත එකී කොටස් ගෙවිය යුතු ආකාරය පිටසන් කළ යුතුය.

(4) ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ එකී තැනැත්තාට ඇත්ත වශයෙන් ම කිසිදු අවසර පත්‍රයක් නිකුත් කරනු නොලැබූ අවස්ථාවක, දිසාපති විසින් 18 වන වගන්තිය යටතේ අවසර පත්‍රයක් එකී තැනැත්තා වෙත නිකුත් කළ යුතුය.

**39.** ඔහුගේ අවසර පත්‍රය මත හෝ ප්‍රදාන පත්‍රය මත 38 වන වගන්තිය යටතේ පිටසනක් කරනු ලැබූ විට, එකී තැනැත්තා විසින්, එකී අවසර පත්‍රයේ හෝ ප්‍රදාන පත්‍රයේ දක්වෙන වාර්ෂික ගෙවීම් වෙනුවට එකී අවසර පත්‍රය මත හෝ ප්‍රදාන පත්‍රය මත පිටසන් කරනු ලැබූ මුදල් ප්‍රමාණ එහි දැක්වෙන ආකාරයට දිසාපති වෙත වාර්ෂික ව ගෙවිය යුතුය.

ගෙවීමේ අලුත් ක්‍රමය.

මේ පනතේ විධිවිධාන පරණ අවසර පත්‍රවලට අදාළ වන බව.

**40.** 38 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ එකී තැනැත්තාගේ අවසර පත්‍රය මත හෝ ප්‍රදාන පත්‍රය මත පිටසන් කරනු ලැබූ විට, එකී තැනැත්තා 18 වන වගන්තිය යටතේ අවසර පත්‍ර දරන්නකු ලෙස සලකනු ලැබිය යුතු අතර අවසර පත්‍ර දරන්නන්ට අදාල මේ පනතේ විධිවිධාන, ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ නිකුත් කරන ලද ඔහුගේ අවසර පත්‍රයෙහි හෝ ප්‍රදාන පත්‍රයෙහි කුමක් සඳහන් ව තිබුණ ද එකී තැනැත්තාට අදාල වන්නේ ය.

ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ වූ ප්‍රදානයක් මේ පනත යටතේ වූ ප්‍රදානයකට හරවනු ලැබීම.

**41.** 38 වන වගන්තිය යටතේ හෝ 39 වන වගන්තිය යටතේ ගෙවීමට නියමිත සියලු ම මුදල් යම් තැනැත්තකු විසින් ගෙවනු ලැබූ අවස්ථාවක, ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රය හෝ ප්‍රදාන පත්‍රය හෝ මේ පනතේ 38 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රය වෙනුවට මේ පනතේ 11 වන වගන්තිය යටතේ ඒ ඉඩම සම්බන්ධයෙන් ප්‍රදාන පත්‍රයක් ඔහුට ලැබිය යුතුය.

ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ වූ අන්සතු කිරීම අවලංගු කිරීම.

**42.** ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ සතු කර දෙනු ලැබූ යම් ඉඩමකට මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වීමට පෙරාතුව ම වූ දිනයෙහි නීත්‍යානුකූල ව හිමිකම් ඇති ව සිටින තැනැත්තකු 36 වන වගන්තිය යටතේ එකී ඉඩම මිලට ගැනීමේ අයිතිය ක්‍රියාත්මක නොකරන අවස්ථාවක අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් වන්දියක් ගෙවා, අමාත්‍යවරයා විසින් ඒ සතු කර දීම අවලංගු කළ හැකිය.

## VII වන පරිච්ඡේදය

### නියෝග

නියෝග සෑදීමේ බලය.

**43.** (1) මේ පනතේ ප්‍රතිපත්ති ඉටු කර ගැනීමේ හා විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින්, කලින් කල, නියෝග සෑදිය හැකිය.

(2) විශේෂයෙන් හා මේ වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරුණු බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැති ව, අමාත්‍යවරයා විසින් පහත සඳහන් කරුණු සියල්ල ම හෝ ඉන් යම් කරුණක් සම්බන්ධයෙන් නියෝග සෑදිය හැකිය :—

(අ) මේ පනත යටතේ ඉඩම් විකුණනු ලැබිය හැකි කාර්යයන් වර්ග කිරීම ;

(ආ) මේ පනත යටතේ ඉඩම් විකුණනු ලැබිය හැකි තැනැත්තන් වර්ග කිරීම ;

(ඇ) ඉඩම් දීමට තැනැත්තන් තෝරා ගනු ලබන ආකාරය ;

(ඈ) නිවේදන ආකෘති හා ඒවා පළ කරනු ලැබිය යුතු ආකාරය ;

(ඉ) ගැණුම් මිළ කොටස්වලින් ගෙවීම සඳහා ඉඩ දිය යුතු උපරිම කාලසීමාව ;

(ඊ) ප්‍රදාන පත්‍ර හා අවසර පත්‍ර ආකෘතිය ;

(උ) මේ පනත යටතේ අය කර ගත යුතු ගාස්තු ;

(ඌ) ප්‍රදාන පත්‍ර හා අවසර පත්‍ර ලියාපදිංචි කිරීම ;

(එ) අවසර පත්‍ර අවලංගු කිරීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය ;

(ඒ) අවසර පත්‍රයක් අවලංගු කිරීමේ දී දිසාපති විසින් අඩු කර ගනු ලැබිය හැකි මුදල ;

(ඔ) දැන්වීම්වල හෝ වෙනත් සිතාසිවල ආකෘති සහ එකී දැන්වීම් හෝ සිතාසි පළ කිරීමේ හෝ භාරදීමේ ආකාරය ;

(ඕ) නියම කළ යුතු යයි මේ පනතින් නියම කොට ඇත්තා වූ ද, ඒ සම්බන්ධයෙන් නියෝග සෑදිය යුතු යයි නියම කොට ඇත්තා වූ ද වෙනත් සියලු කරුණු ; හා

(ක) මේ පනතෙහි සඳහන් කරුණුවලට ආනුෂංගික හෝ සම්බන්ධ සියලු කරුණු.

(3) (අ) මේ පනත යටතේ ඉඩම් විකුණනු ලැබිය හැකි කාර්යයන් අතුරින් යමක් වතු බෝග වගා කිරීම සඳහා වූ කාර්යයක් වන විට එම කාර්යයන් වර්ග කිරීම සඳහා ; සහ

(ආ) වතු බෝග වගා කිරීම සඳහා මේ පනත යටතේ ඉඩම් විකුණනු ලැබිය හැකි තැනැත්තන් තෝරා ගැනීම සඳහා

නියෝග සාදනු ලබන විට, ඒ නියෝග සෑදිය යුත්තේ වැවිලි කර්මාන්ත විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිවය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර එකී පළ කිරීමේ දිනයෙහි සිට එය ක්‍රියාත්මක වන්නේය.

(5) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මණින් අනුමතිය සඳහා ජාතික රාජ්‍ය සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් නොමැති ව එකී අනනුමතියේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබේ.

(6) අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකෙන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතුය.

## VIII වන පරිච්ඡේදය

### පොදු විධිවිධාන

**44.** අවසර පත්‍රයක් පිට සතු කරනු ලැබූ යම් ඉඩමක් සන්තක ව සිටීමේ හේතුවෙන් කිසි ම තැනැත්තකු විසින් වෙන යම් තැනැත්තකුට අහිතකර ව හෝ ශ්‍රී ලංකා ජනරජයට අහිතකර ව හෝ එකී ඉඩම් සම්බන්ධයෙන් යම් කාලාපගමනමය අයිතියක් අත් කර නොගත හැකි වන්නේය.

අවසර පත්‍රයක් යටතේ අත් සතු කරනු ලැබූ ඉඩමක් සම්බන්ධයෙන් කාලාපගමනමය අයිතියක් අත්කර ගැනීමක් නොවිය යුතු බව.

ප්‍රදාන පත්‍රයක් හෝ අවසර පත්‍රයක් යටතේ දරනු ලබන ඉඩමක් බැහැර කිරීමේ සාධන පත්‍රයක් සහතික කිරීම නොතාරිස්වරුන්ට තහනම් බව.

**45.** (1) මේ පනත යටතේ වූ ප්‍රදාන පත්‍රයක් හෝ අවසර පත්‍රයක් පිට දරනු ලබන්නා වූ යම් ඉඩමක් බැහැර කිරීමක් ලෙස ක්‍රියාත්මක වන්නා වූ ද මේ පනතේ විධිවිධාන කඩ කරන්නා වූ ද සාධන පත්‍රයක් නොතාරිස්වරයකු විසින් සහතික නොකළ යුතුය.

(2) මේ වගන්තියේ විධිවිධාන කඩකරමින් ලියා අත්සන් කරන ලද හෝ සහතික කරන ලද සාධන පත්‍රයක් ශුන්‍ය හා බල රහිත වන්නේය.

45 වන වගන්තිය කඩ කරමින් ඔප්පුවක් සහතික කරන නොතාරිස්වරයකු වරදක් කරන බව.

**46.** 45 වන වගන්තියේ විධිවිධාන කඩ කරමින් යම් ඔප්පුවක් දැන දැන ම සහතික කරන නොතාරිස්වරයකු වරදක් කරන අතර ලඝු නඩු විභාගයකින් පසු මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබීමෙන් පසු රුපියල් පන් සියයකට නො වැඩි දඩයකට ඔහු යටත් වන්නේය.

අයුතු ලෙස ඇදා ගැනීම සඳහා දඬුවම.

**47.** (1) අවසර පත්‍රයක් පිට මේ පනත යටතේ අන් සතු කරනු ලැබූ යම් ඉඩමක් යම් තැනැත්තකු විසින් අයුතු ලෙස ඇදා ගන්නා අවස්ථාවක, ඔහු වරදක් කරන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී, රුපියල් පන් සියයකට නොවැඩි දඩයකට හෝ හය මාසයකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ එකී දඩය හා බන්ධනාගාරගත කරනු ලැබීම යන දඬුවම් දෙකට ම හෝ යටත් වන්නේය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ නඩු පැවරීම අයුතු ලෙස ඇදා ගනු ලැබූ ඉඩම පිහිටි පරිපාලන දිස්ත්‍රික්කයෙහි දිසාපති විසින් හෝ ඒ සඳහා ඒ දිසාපති විසින් බලය පවරනු ලැබූ යම් නිලධරයකු විසින් හෝ කළ යුතුය.

(3) (1) වන උපවගන්තිය යටතේ යම් ඉඩමක් අයුතු ලෙස ඇදා ගෙන සිටින යම් තැනැත්තකුට එකී ඉඩම රජයට අයත් නොවන් බව කියා සිටීමට හෝ ඔප්පු කිරීමට හෝ එකී ඉඩම සම්බන්ධයෙන් නිකුත් කරන ලද යම් අවසර පත්‍රයක වලංගු භාවය ප්‍රශ්න කිරීමට ඉඩ නැත්තේය.

(4) (1) වන උපවගන්තිය යටතේ වූ වරදකරු කිරීමක් 33 වන වගන්තිය යටතේ කරන ලද නෙරපීමේ ආඥාවක් ලෙස ක්‍රියාත්මක වන අතර එසේ වරදකරු කරනු ලැබීමෙන් පසු අයුතු ලෙස ඇදා ගනු ලැබූ ඉඩම පිහිටි පරිපාලන දිස්ත්‍රික්කයෙහි දිසාපති විසින් හෝ වෙන යම් නියමිත නිලධරයකු විසින් එකී නෙරපීමේ ආඥාව ක්‍රියාත්මක කිරීම සඳහා 34 වන වගන්තිය යටතේ මහෙස්ත්‍රාත්වරයා වෙත ඉල්ලුම් කළ හැකිය.

අන් සතු කරනු ලැබූ ඉඩමක් සම්බන්ධයෙන් රජයට විරුද්ධ ව අයිතිය ඔප්පු කිරීමේ නඩුවක් පවත්වා ගෙන යා හැකි බව.

**48.** (1) අන් සතු කරනු ලැබූ යම් ඉඩමකට අයිතිය ඇති බැව් කියා පාන යම් තැනැත්තකු විසින් තම අයිතිය ඔප්පු කිරීම සඳහා රජයට විරුද්ධ ව නඩුවක් පැවරීම මේ පනතේ කිසිවකින් වළක් වනු නොලැබේ. එහෙත් අවස්ථාවෝචිත පරිදි ප්‍රදානයක් දරන්නා වෙත හෝ අවසර පත්‍ර දරන්නා වෙත සතු කර දෙනු ලැබූ යම් ඉඩමක් සම්බන්ධයෙන් අයිතිය ඔප්පු කිරීම සඳහා රජයට විරුද්ධ ව නඩු පැවරීමට එකී ප්‍රදානයක් දරන්නා හෝ අවසර පත්‍ර දරන්නා මේ වගන්තියේ කිසිවකින් බලය හෝ අධිකාරය නො ලබන්නේය.

(2) වෙන යම් නීතියක කුමක් සඳහන් ව තිබුණ ද—

(අ) (1) වන උපවගන්තියෙහි සඳහන් යම් ඉඩමක් සම්බන්ධයෙන් රජයට විරුද්ධව අයිතිය ඔප්පු කිරීමේ නඩුවක් තීරණය කරනු ලැබුවේ යම් තැනැත්තකුගේ වාසියට ද එකී තැනැත්තාට විරුද්ධ ව රජය විසින් හෝ මේ පනත යටතේ එකී ඉඩම සතු කරනු ලැබූ යම් තැනැත්තකු විසින් හෝ ඒ ඉඩම මත කරන ලද යම් වැඩි දියුණු කිරීමක වටිනාකම ලබා ගැනීම සඳහා නඩු පැවරීමට රජයට අයිතිය ඇත්තේය ; තව ද

(ආ) ඒ ඉඩම එසේ සතු කර දෙනු ලැබූ තැනැත්තකු විසින් ඒ ඉඩම භුක්ති විඳීමෙන් ඇති වන අලාභ ලබා ගැනීම සඳහා රජයට විරුද්ධ ව කිසිදු අධිකරණයක කිසිදු නඩුවක් පවත්වාගෙන යා නො හැකිය.

**49.** (1) මේ පනත යටතේ අන් සතු කරනු ලැබූ යම් ඉඩමක අයිතිය ඔප්පු කිරීම සඳහා රජයට විරුද්ධ ව යම් තැනැත්තකු විසින් පවරනු ලැබූ නඩුවක් ඒ තැනැත්තාගේ වාසියට තීරණය කරනු ලැබූ අවස්ථාවක සහ ඒ ඉඩම රජය විසින් අත් කර ගැනීම අමාත්‍යවරයා අනුමත කරන අවස්ථාවක ඒ ඉඩම මහාජන කාර්යයක් සඳහා අත් කර ගනු ලැබිය යුතු ලෙස සලකනු ලබන අතර ඒ අනු ව ඉඩම් අත් කර ගැනීමේ පනත යටතේ අනිවාර්යයෙන් අත් කර ගත හැකිය.

48 වන වගන්තිය යටතේ අයිතිය ඔප්පු කරනු ලැබූ ඉඩම අත්කර ගැනීමේ බලය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් කරනු ලැබුවා වූ ද ඉඩම් අත් කර ගැනීමේ පනත යටතේ අත් කර ගනු ලැබුවා වූ ද යම් ඉඩමක් සම්බන්ධයෙන් වන්දි තක්සේරු කිරීමේ කාර්යය සඳහා ඉඩම් අත් කර ගැනීමේ පනතේ 45 වන වගන්තියෙහි (1) වන උපවගන්තියෙහි යෙදෙන "ඒ දැන්වීම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දිනයෙහි" යන වචන වෙනුවට "රජයේ ඉඩම් විකිණීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ රජය විසින් ඒ ඉඩම අන් සතු කිරීමේ දිනයට පෙරාතුව ම වූ දිනයෙහි" යන වචන ආදේශ කරනු ලැබුවාක් මෙන් එකී උපවගන්තිය බල පැවැත්විය යුතුය.

**50.** මේ පනත යටතේ රාජ්‍ය නිලධරයකු විසින් සද්භාවයෙන් කරනු ලැබූ යම් දෙයක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධ ව කිසිදු නඩුවක් නොපැවරිය යුතුය.

රාජ්‍ය නිලධරයන්ගේ ආරක්ෂාව.

**51.** අන්තිම කැමති පත්‍රයක් නොමැති අවස්ථාවක ඉඩම් උරුම වීම සම්බන්ධයෙන් මේ පනතේ විධිවිධාන නොවන වෙනත් කිසිදු ලිඛිත නීතියක් මේ පනත යටතේ අන් සතු කරනු ලැබූ යම් ඉඩමක් සම්බන්ධයෙන් අදාළ නොවන්නේ ය.

මේ පනත යටතේ විකුණනු ලැබූ ඉඩම්වලට සාමාන්‍ය නීතිය අදාළ නොවීම.

**52.** මේ පනත යටතේ අන් සතු කරනු ලැබූ යම් ඉඩමක් ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 2 දරන කෘෂිකාර්මික පලදා වර්ධන පනතෙහි "කෘෂිකාර්මික ඉඩම" යන යෙදුමේ අර්ථානුකූල ව කෘෂිකාර්මික ඉඩමක් ලෙස සලකනු ලැබේ.

මේ පනත යටතේ අන් සතු කරනු ලැබූ ඉඩම්වලට කෘෂිකාර්මික පලදා වර්ධන පනත අදාළ වන බව.

ඉඩම් සංවර්ධන ආඥාපනතේ II වන හා III වන පරිච්ඡේද ඉවත් කිරීම.

53. ඉඩම් සංවර්ධන ආඥාපනතේ II වන හා III වන පරිච්ඡේද (8 වන වගන්තියෙහි සිට 24 වන වගන්තිය දක්වා වූ වගන්ති, ඒ වගන්ති දෙකම ඇතුළුව) මෙයින් ඉවත් කරනු ලැබේ.

වෙනත් ලිඛිත නීති සංශෝධනය කිරීම.

54. (1) 1969 අංක 16 දරන ඉඩම් සංවර්ධන (සංශෝධන) පනතේ 90 වන වගන්තියෙන් සංශෝධිත කෘෂිකාර්මික හා කාර්මික ණය සංසථා ආඥාපනතේ 51 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි (ආආ) ඡේදයට ඉක්බිති ව ම පහත සඳහන් අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් ඒ ආඥාපනත මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:—

"(ආආආ) රජයේ ඉඩම් විකිණීමේ (විශේෂ විධිවිධාන) පනතේ විධිවිධාන යටතේ විකිණීමක මාර්ගයෙන් අන් සතු කරනු ලැබූ ඉඩම් පිළිබඳ ප්‍රදාන පත්‍රයක් දරන්නකුට මුදල් ණයට දීම;".

(2) 1969 අංක 16 දරන ඉඩම් සංවර්ධන (සංශෝධන) පනතේ 90 වන වගන්තියෙන් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 5 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි (අ) ඡේදය පහත සඳහන් පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:—

(අ) ඒ ඡේදයේ (v) අනුඡේදය (vi) අනුඡේදය වශයෙන් නැවත අංක කිරීමෙන්; හා

(ආ) ඒ ඡේදයෙහි (iv) අනුඡේදයට ඉක්බිති ව ම පහත සඳහන් අලුත් අනුඡේදය ඇතුළත් කිරීමෙන්:—

"(v) රජයේ ඉඩම් විකිණීමේ (විශේෂ විධිවිධාන) පනතේ විධිවිධාන යටතේ විකිණීමක මාර්ගයෙන් අන් සතු කරනු ලැබූ ඉඩම් පිළිබඳ ප්‍රදාන පත්‍ර දරන තැනැත්තන්ට කෙටි කාලීන, මධ්‍යම කාලීන හා දීර්ඝ කාලීන ණය හා වෙනත් පහසුකම් සැලැස්වීම;".

අර්ථ නිරූපණය.

55. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ පනතෙහි,—

"අතුරු බෙදුම් ඒකකය" යන්නෙන් මේ පනත යටතේ වූ අවසර පත්‍රයක් හෝ ප්‍රදාන පත්‍රයක් යටතේ දරනු ලබන ඉඩමක් නීත්‍යනුකූල ව අතුරු කොටස්වලට බෙදිය නොහැකි අවම ඉඩම් ප්‍රමාණය අදහස් වේ;

"අධිකරණය" යන්නෙන් අධිකරණ ආඥාපනත යටතේ පිහිටුවන ලද යම් අධිකරණයක් අදහස් වන අතර එයට ගම්බද අධිකරණයක් ද ඇතුළත් වේ;

"අන් සතු කිරීම" යන්න, එහි වෛයාකරණ ප්‍රභේද හා සජාතීය යෙදුම් සමග ගත් විට මේ පනත යටතේ රජය ඉඩම් අන් සතු කිරීම ඉන් අදහස් වේ;

"අයිතිය" යන්නෙන් අයිතිවාසිකමක්, අයිතියක් හෝ සම්බන්ධතාවක් අදහස් වේ;

"අවසර පත්‍ර දරන්නා" යන්නෙන් මේ පනත යටතේ හෝ ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ අවසර පත්‍රයක් නිකුත් කරනු ලැබූ තැනැත්තෙක් අදහස් වේ;

"අවසර පත්‍රය" යන්නෙන්, ඉඩම් බුත්තිය සඳහා මේ පනත යටතේ හෝ ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයක් අදහස් වේ;

"ඉඩම් කොමසාරිස්" යන්නෙන් ඉඩම් සංවර්ධන ආඥාපනතේ 3 වන වගන්තිය යටතේ පත් කරන ලද නිලධරයා අදහස් වන අතර එයට අතිරේක ඉඩම් කොමසාරිස්, නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් සහ මේ පනතේ යම් විශේෂ කරුණක් හෝ විධිවිධානයක් සම්බන්ධයෙන් ඉඩම් කොමසාරිස් විසින් ලියවිල්ලකින් බලය දෙන ලද ඔහුගේ දෙපාර්තමේන්තුවේ වෙන යම් නිලධරයෙක් ද ඇතුළත් වේ;

"දිසාපති" යන්නට අතිරේක දිසාපති, සහකාර දිසාපති, අතිරේක සහකාර දිසාපති, දිසා ඉඩම් නිලධරයා සහ මේ පනතේ යම් විශේෂ කරුණක් හෝ විධිවිධානයක් සම්බන්ධයෙන් දිසාපති විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබූ යම් නිලධරයෙක් ද ඇතුළත් වේ;

"නියමිත" යන්නෙන් මේ පනතින් හෝ ඒ යටතේ සාදන ලද නියෝගවලින් නියම කරනු ලැබූ බව අදහස් වේ;

"ප්‍රදාන පත්‍රයක් දරන්නා" යන්නෙන් මේ පනත යටතේ ප්‍රදාන පත්‍රයක් නිකුත් කරනු ලැබූ යම් තැනැත්තෙක් අදහස් වේ;

"ප්‍රදානය" යන්නෙන්, පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මේ පනත යටතේ ශ්‍රී ලංකා ජනරජයෙන් කරනු ලැබූ ඉඩම් ප්‍රදානයක් අදහස් වේ ;

"බැහැර කිරීම" යන්න, එහි වෛයාකරණ ප්‍රභේද සහ සජාතීය යෙදුම් සමග ගත් විට ඉඩම්වලට හෝ ඒවායේ අයිතියට බලපාන කවර හෝ ස්වභාවයක ගණුදෙනුවක් ඉන් අදහස් වන අතර එයට ඉඩම් පිළිබඳ සින්නක්කර පැවරුමක්, අන්තිම කැමති පත්‍රයකින් පැවරුමක්, පරිත්‍යාගයක්, හුවමාරු කිරීමක්, බදු දීමක්, උකස් කිරීමක් හෝ පැවරුමක් ද ඇතුළත් වේ;

"මහජන බැංකුව" යන්නෙන්, 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ පිහිටුවන ලද බැංකුව අදහස් වේ;

"ලංකා කෘෂිකාර්මික හා කාර්මික ණය සංස්ථාව" යන්නෙන් කෘෂිකාර්මික හා කාර්මික ණය සංස්ථා ආඥාපනත යටතේ පිහිටුවන ලද සංස්ථාව අදහස් වේ;

"ලංකා බැංකුව" යන්නෙන් ලංකා බැංකු ආඥාපනත යටතේ පිහිටුවන ලද බැංකුව අදහස් වේ;

"ලියාපදිංචි කළ සමිතිය" යන්නට ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනතෙහි දී ඇති අර්ථය ම ඊට ඇත්තේ ය;

" වතු බෝග " යන්නෙන් තේ, රබර් සහ පොල් අදහස් වන අතර වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ විෂය ප්‍රමාණයට අයත් වන වෙනත් යම් බෝගයක් ද ඊට ඇතුළත් වේ ;

" ශ්‍රී ලංකා පුරවැසියා " යන්නෙන් පුරවැසි භාවයට අදාළ ව තත් කාලයෙහි බලපවත්නා යම් නීතියක් යටතේ ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන පුද්ගලයෙක් අදහස් වේ ;

" සර්වේයර් ජනරාල් " යන්නෙන් ශ්‍රී ලංකාවේ සර්වේයර් ජනරාල් හෝ මේ පනතේ කාර්යයන් සඳහා ඔහු වෙනුවෙන් ක්‍රියා කිරීමට වෙන යම් නිලධරයකු නියෝජ්‍ය කරන ලද්දේ නම්, එසේ නියෝජ්‍ය කරනු ලැබූ ප්‍රමාණයට ඒ වෙන යම් නිලධරයාද අදහස් වේ ; තවද

" සාම නිලධරයා " යන්නෙන්, පොලිස් නිලධරයකු අදහස් වන අතර පොලිස් කාර්යයන් කිරීමට දිසාපති විසින් ලියවිල්ලකින් පත් කරනු ලැබූ ග්‍රාම සේවකයෙක් ද එයට ඇතුළත් වේ.

## උපලේඛනය

### රීති

1. මේ පනත යටතේ ප්‍රදාන පත්‍රයක් හෝ අවසර පත්‍රයක් පිට අන් සතු කරනු ලැබූ ඉඩමක අයිතිය එකී ප්‍රදාන පත්‍රය හෝ අවසර පත්‍රය දරමින් සිට මිය ගිය තැනැත්තාගේ ජීවත් ව සිටින සැමියාට හෝ බිරිඳට උරුම වේ. එකී සැමියා හෝ බිරිඳ නොමැති අවස්ථාවක එකී ප්‍රදාන පත්‍රය හෝ අවසර පත්‍රය දරමින් සිටි තැනැත්තාගේ ඥාතීන් අතුරින් මෙහි පහත දැක්වෙන චක්‍රයෙහි පිළිවෙලින් දැක්වෙන ප්‍රමුඛතාව අනු ව එක් කෙනකුට පමණක් උරුම වන්නේ ය. එක් කණ්ඩායමකට අයත් ඥාතීන් එක් කෙනකුට වැඩි ගණනක් සිටින අවස්ථාවක බාල තැනැත්තන්ට වඩා වැඩි මහලු තැනැත්තන් කෙරෙහි වැඩි සැලකිල්ල ලැබිය යුතුය.

### චක්‍රය

1. පුත්‍රයෝ
2. දුහිතෘවරු
3. මුණුබුරෝ
4. මිණිබිරියෝ
5. පියා
6. මව
7. සහෝදරයෝ
8. සහෝදරියෝ
9. දෙමව්පියන්ගේ සහෝදරයෝ
10. දෙමව්පියන්ගේ සහෝදරියෝ
11. දෙමව්පියන්ගේ සහෝදර සහෝදරියන්ගේ පුත්‍රයෝ
12. දෙමව්පියන්ගේ සහෝදර සහෝදරියන්ගේ දුහිතෘවරු.

මේ රීතිවල " ඥාතියා " යන්නෙන් විවාහයෙන් නොව ලේ නෑකමින් ඥාතියකු වන තැනැත්තෙක් අදහස් වේ.

2. උරුමවීමට එක සමාන අන්දමින් අයිතිය ඇති හා කැමති සමාන වයසේ සිටින තැනැත්තන් දෙදෙනකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් 1 වන රීතියෙහි දැක්වෙන චක්‍රයෙහි සඳහන් වන යම් ඥාතීන් කණ්ඩායමක සිටින අවස්ථාවක ඉඩමේ උරුමයට එකී තැනැත්තන් අතුරින් එක් තැනැත්තකු දිසාපති විසින් නම් කළ හැකි අතර දිසාපතිගේ එකී තීරණය අවසාන හා තීරණාත්මක වන්නේ ය.